මහව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
-----------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ලැබිය යුතු රු.96,500 ක සභික දීමනා ප්‍රමාණය ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). 2012 කර්මාන්ත ණයහිමි වැඩිපුර වෙන්කිරීම් රු.4,048,653 ක් සමාලෝචිත වර්ෂයේදී ඉවත්කිරීමේදී සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීම වෙනුවට ජ'නල් සටහන් අංක 40 මගින් ප්‍රාග්ධන වියදම් ගිණුම බැර කිරීම මත වර්ෂයේ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව ලද රු.160,770 ක ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු ආදායම්, වර්ෂයේ ආදායමට නොගෙන ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු තැන්පතු යටතේ දක්වා පසුව ජ'නල් සටහන් අංක 68 මගින් අධිකතා ඌණතා ගිණුමට බැර කිරීම මත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). 2013 භාණ්ඩ සමීක්ෂණ සිදුකල පුස්තකාල 04 කට අදාලව සමීක්ෂණ අනුව පුස්තකාල පොත් වටිනාකම රු.3,508,801 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,790,126 ක් ලෙස දැක්වීම මත පුස්තකාල පොත් ශේෂය රු.718,675 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවියයුතු ශේෂය රු..3,805,472 ක්ව තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව බිල් කිරීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 09 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු .43,022,899 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.74,164,328 ක්වූ අතර, එයින් රු.6,768,586 ක් වසර 03 කට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.53,954,999 ක්වූ අතර, එයින් රු.5,321,870 ක් වසර 1 කට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .65,863,683 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,165,912 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,373,055 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,538,967 ක වර්ධනයක්

පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.26,455,018 ක් වූ ප්‍රාග්ධන ආදායම් හා රු.20,425,531 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.10,195,399 දක්වා වැඩිවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.52,783,668 කින් සියයට 67 ක් වූ රු.35,492,948 ක් පමණ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.26,455,018 ක ප්‍රමාණයම මෙහෙයුම් ආධාර, පළාත් ආයෝජන, මගනැගුම හා වයඹ පුබුදුව වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.48,617,756 කින් සියයට 66 ක් වූ රු.32,282,330 ක් පමණ පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 69 ක් ලෙස රු.22,170,678 ක් පමණ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.20,425,531 කින් සියයට 7 ක් වූ රු.1,345,221 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබුණ අතර, ඉතිරි සියයට 93 ක් වූ රු.19,080,310 ක් පමණ ප්‍රමාණය ගමනැගුම, මගනැගුම, පළාත් ආයෝජන, වයඹ පුබුදුව වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩ කුලී, බදු කුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතුකිරීම සඳහා නිශ්චිත බලයක් නොතිබුණද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම්ද ක්ෂේත්‍රයේදී එකතුකර තිබුණි.

2.3.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,641,903 ක් වූ අතර වාර්ෂික බිල්කිරීම් රු.1,940,208 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරිමක් කර නොතිබුණි.

2.3.3 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද, සභාව විසින් පනවන ලද බද්ද කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් විසින් දින 7 ක් ඇතුලත ගෙවන ලෙස නිවේදනය කර නොතිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධන ඇගයීම</u>

සභා බල ප්‍රදේශයෙහි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 19 ක් පිහිටුවා ඇති අතර ගාස්තු අයකිරීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම සභා බල ප්‍රදේශය තුල වීථි පහන් 1292 ක් සවිකර පැවති අතර, උපකරණ වැය වශයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.788,740 ක වියදමක් දරා තිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

සභාව විසින් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 290ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා ගෙන නොතිබූ අතර, ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම හෝ අනුකූලතා සහතික නොමැතිව එම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට එරෙහිව කටයුතු කර නොතිබුණි.

3.3 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

සංචාරක කටයුතු අමාත්‍යාංශ ආධාර මත රු.3,664,947 ක පිරිවැයට 2008 වර්ෂයේදී නව බස් නැවතුම්පල පරිශ්‍රයේ වැසිකිලි පද්ධතියක් ඉදිකර තිබූ අතර, ඉදිකිරීම් අවසන් කර වර්ෂ 04 කට අධික කාලයක් ගතවී ඇතත් ජල හා විදුලි සම්බන්ධතා ලබාගෙන නොතිබූ අතරම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. 2013 අගෝස්තු 28 සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී ගොඩනැගිල්ලට අලාභහානි කිරීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

3.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පළාත් පාලන අමාත්‍යාංශ ආධාර (2012) යටතේ රු.16,000,000 ක ඇස්තමේන්තුගත මුදලක් මත මහව නගර ශාලාව ඉදිකිරීම 2012 සැප්තැම්බර් 11 දින සිවිල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ මාස 03 කින් නිමකිරීම සඳහා ගිවිසුම් ගතව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අදාල වැඩ වලින් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් වත් ඉටුකර නොතිබුණි. 2012 නොවැම්බර් මස නැවත රු.3,430,302 ක අතිරේක ඇස්තමේන්තුවක් පිළියෙල කර අදාල වැඩ කොටස් සිදුකරමින් පැවතියද ඊට අදාල අතිරේක ගිවිසුමකට එළඹ නොතිබුණි.

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව වියදම් ඇස්තමේන්තුව රු.72,547,000 ක් වුවත්, ඒ යටතේ පුනරාවර්තන වියදම්වලට අදාලව රු.161,000 ක් හා ප්‍රාග්ධන වියදම්වලට අදාලව රු.6,175,000 ක ප්‍රතිපාදන ඉක්මවීම් පැවතුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය